16 FEB 2026
නීති අංශය
රාජගිරිය



# පොදුජන එක්සත් පෙරමුණ (සංශෝධිත) ව්‍යවස්ථාව 2024

මැතිවරණ කොමිෂන්
16 FEB 2026
නීති අංශය
රාජගිරිය

# පොදුජන එක්සත් පෙරමුණේ ව්‍යවස්ථාව (සංශෝධිත) 2024

01. රටේ සාමාජීය, ආර්ථික හා දේශපාලන වාතාවරණය හමුවේ නීති හා අනේක විධ මැතිවරණ උපක්‍රමයන් පිළිබඳ විධිමත්ව සලකා බලා ආණ්ඩුවේ ප්‍රතිපත්ති පාලන ක්‍රමවේදයක් ලෙස සියලු දෙනා විසින් අනිවාර්යයෙන්ම කළ යුතු වන්නේ, දේශපාලන පක්ෂ අතර ඇති කරගන්නා මැතිවරණ සන්ධාන ඇතුළු සියලු සාමාජික ප්‍රයත්න දැරීම වන හෙයින් මෙන්ම මේ සඳහා වර්තමානයේ රට මුහුණ දී ඇති ආර්ථික අර්බුදය ජය ගැනීමත් මේ සියවසේ ගෝලීය ප්‍රවණතාවයන් සමඟ ශ්‍රී ලංකාව ඉදිරියට ගෙනයෑම සඳහාත්, මෙන්ම අප එක් එක් පක්ෂයේ පොදු පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීමෙහිලා එවැනි ප්‍රයත්නයන් දැරීම වන හෙයින්ද, ශ්‍රී ලංකා පරමාධිපත්‍ය දරණ මහජනතාවගේ නියෝජිතයන් වන අපි පොදුජන එක්සත් පෙරමුණ යනුවෙන් සඳහන් කරනු ලබන හා එසේ හඳුන්වනු ලබන මැතිවරණ සන්ධානයක් යටතේ මෙසේ ඒකරාශි විය යුතු යැයි තීරණය කළෙමු.

(අ) පොදුජන එක්සත් පෙරමුණේ ලියාපදිංචි කාර්යාලය 301, ටී බී ජයා මාවත, කොළඹ 10 වේ.

(ආ) පොදුජන එක්සත් පෙරමුණේ නිල ලාංඡනය පුටුව ලකුණ වේ.

මැතිවරණ කොමිෂන් සභාව
නීති අංශය
රාජගිරිය

## 02. අරමුණ හා පරමාර්ථ

1. ජාතික නිදහස, ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම.

2. සාමාජීය යුක්තිය හා මානව අයිතිවාසිකම් පදනම් කරගත් සමාජයක් බිහිකිරීමට කටයුතු කිරීම.

3. ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් හා පිළිවෙත් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

4. ශ්‍රී ලාංකික ජනතාවගේ ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා ආධ්‍යාත්මික උන්නතිය ප්‍රවර්ධනය කිරීම.

5. ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජනවාර්ගිකත්වය, ආගමික ඇදහිලි, ගෝත්‍රය හෝ ලබ්ධිය කුමක් වුවද, ඔවුන් සියලු දෙනාම, සමානාත්මතාවයෙන් සැලකීම් හා ඔවුන් සියලු දෙනාටම සමාන අවස්ථාවන් ලබා දීමේ පදනම මත ශ්‍රී ලංකාවේ සියලු ප්‍රජාවන් අතර ජාතික සමගිය හා මිත්‍රත්වය සහ සහයෝගය ප්‍රවර්ධනය කිරීම.

6. හෘද සාක්ෂි නිදහස, ආගමික වන්දනා හා පිළිවෙත් පිළිබඳ නිදහස පිළිගැනීම.

7. නොබැඳි ප්‍රතිපත්ති අනුගමනය කරමින් සහ වෙනත් රටවල ජාතික විමුක්තිය ප්‍රජාතන්ත්‍රවාදය හා සාමාජික ප්‍රගතිය පතා කෙරෙනා ජනතා අරගලවලට සහාය දීම.

8. ලෝකයෙන්ම සාමය, සාමාන්‍ය හා පරිපූර්ණ නිරායුධකරණය වෙනුවෙන් අවශ්‍ය සියලු ක්‍රියාමාර්ගයන් වෙත හැමවිටම ඉදිරිපත් වීම.

9. පරිසරය සුරැකීම සබැඳියෙන් අත්‍යවශ්‍ය අංගයක් ලෙස පිළිගනිමින් තිරසාර සංවර්ධනයක් වෙනුවෙන් කැපවීමටද,

10. කාන්තාවන් තරුණයින් හා දරුවන්ගේ මානසික අයිතීන් සුරක්ෂිත කරන සමාජයක් බිහි කිරීම අධිෂ්ඨාන කර ගනිමින්ද,

11. රටේ ආර්ථිකය වර්ධනය කර ගනිමින් ජනතාවගේ දෛනික ජීවිතය වඩා සැපවත් කිරීමේ අරමුණින් ක්‍රියා කිරීම.

## 03. සාමාජිකත්වය

1. මෙහි (මින්මතු සන්ධානය යනුවෙන් සඳහන් කරනු ලබන) පොදුජන එක්සත් පෙරමුණ සන්ධානයේ පරමාර්ථයන්ට දායක වන්නා වූ සහ එහි ව්‍යවස්ථාවලිය පිළිගන්නා වූ ද, මෙහි (මින්මතු "සාමාජික සංවිධාන" යනුවෙන් සඳහන් කරනු ලබන) පිළිගත් දේශපාලන පක්ෂවල හා කණ්ඩායම්වල එකතුවක් වන්නේය.
2. සෑම සාමාජික සංවිධානයක්ම හා කණ්ඩායමක් සංවිධානයේ ශාඛාවක් වශයෙන් සැලකිය යුත්තේය.
3. මෙහි ප්‍රකාශිත අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීමේ අරමුණ හා පරමාර්ථ ඉටුකර ගැනීමේ කාර්යය සඳහා සම්බන්ධ වන පිළිගත් දේශපාලන පක්ෂවල හා කණ්ඩායම්වල සෑම සාමාජිකයෙකුම සන්ධානයේ සාමාජිකයෙකු ලෙස සැලකිය යුත්තේය.
4. සංවිධානයේ පරමාර්ථ හා ව්‍යවස්ථාවලියේ පිළිගනු ලබන කවර වූ හෝ සංවිධානයකට සහ කණ්ඩායමකට මෙම ව්‍යවස්ථාවලියේ ප්‍රතිපාදනයන් අනුව ගනු ලබන තීරණයන් මත සන්ධානයේ සාමාජික සංවිධානයක් හෝ කණ්ඩායමක් වශයෙන් සන්ධානයට සම්බන්ධ විය හැක්කේය. මේ සඳහා නායකත්ව මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුත්තේය.

5. සන්ධානයේ සාමාජිකත්වය සඳහා මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුව විසින් නියම කරනු ලබන වාර්ෂික දායක මුදලක් සෑම සාමාජික සංවිධානයක් හා කණ්ඩායමක් විසින්ම ගෙවිය යුත්තේය.

## 04. ජාතික සම්මේලනය

1. මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුව විසින් කලින් කළ එහි ජාතික සම්මේලනය රැස්කළ යුත්තේය.
2. අනෙකුත් සාමාජික පිළිගත් දේශපාලන පක්ෂ හා කණ්ඩායම් විසින් නම් කරනු ලබන නියෝජිතයන්ගේ මුළු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ජාතික සම්මේලනය සඳහා නම් කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඇති අතර, පහළොස් දෙනෙකු නම් කිරීමට සෙසු එක් එක් සාමාජික දේශපාලන පක්ෂවලට හා කණ්ඩායම්වලට සංවිධානයකට හිමිකම් ඇත්තේය.
3. නායකයා විසින් ඔහු හෝ ඇය නොමැති අවස්ථාවලදී නායකත්ව මණ්ඩලය නම් කරනු ලබන කෙනෙකු මූලාසන හෙබවිය යුත්තේය.
4. මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සාකච්ඡාවට භාජනය කිරීම, සංවිධානයේ වාර්ෂික සාමාජික මුදල නියම කිරීම සහ මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුව විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා සම්මත හා ව්‍යවස්ථාවලියේ සංශෝධන පිළිගැනීම ජාතික සම්මේලනය විසින් කරනු ලැබිය යුත්තේය.
5. ජාතික සම්මේලනය රැස් කිරීම හා එහි කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ රීති මධ්‍යම කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේය.

## 05. මධ්‍යම කෘත්‍යාධිකාරී මණ්ඩලය - සංයුතිය හා බලතල

1. (අ) මෙම වගන්තියේ (ආ) උපවගන්තිය නියමිත පදනම මත අනෙකුත් සාමාජික පිළිගත් දේශපාලන පක්ෂ හා කණ්ඩායම් විසින් නම් කරනු ලබන තැනැත්තන්ගෙන් මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුව සමන්විත විය යුත්තේය.

(ආ) අනෙකුත් සාමාජික පිළිගත් දේශපාලන පක්ෂ හා කණ්ඩායම් විසින් නම් කරනු ලබන තැනැත්තන්ගේ මුළු සංඛ්‍යාවට සමාන තැනැත්තන් සංඛ්‍යාවක් මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුව සඳහා නම් කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බලය ඇති අතර, පුද්ගලයන් තුන්දෙනෙකු නම් කිරීමට සෙසු එක් එක් අනෙකුත් සාමාජික පිළිගත් දේශපාලන පක්ෂ හා කණ්ඩායම් විසින් නම් කිරීමට හිමිකම් ඇත්තේය.

## 06. මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුව සහ එහි නිලතල

(අ) සන්ධානයේ නිළධරයන් විය යුත්තේ,

I. නායක - නායකත්ව මණ්ඩලයේ ප්‍රධාන රැස්වීමේ දී නායකත්ව මණ්ඩලය නියෝජනය කරන සාමාජික සාමාජිකාවන් අතුරින් එක් අයෙකු තෝරාපත් කර ගත යුතුය. එම තෝරා ගන්නා ඔහු හෝ ඇය සන්ධානයේ නායක තනතුර හා නායකත්ව මණ්ඩලයේ ප්‍රධානියා ද වනු ඇත. (නායකත්ව මණ්ඩලය විසින් යම් දිනක වෙනත් තීන්දුවක් ගන්නා තෙක් නායක ධූරය දරණ තැනැත්තා හෝ තැනැත්තිය නායකත්ව තනතුර හෙබවිය යුතුය.)

II. ලේකම් - නායකත්ව මණ්ඩලය විසින් තෝරා පත්කර ගත යුතුය. නායකත්ව මණ්ඩලය විසින් අන් ලෙසකින් තීන්දුවක් ගන්නා තෙක් ලේකම් ධූරය දරණ තැනැත්තා එම ධූරය හෙබවිය යුතුය.

III. භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් නම් කරනු ලබන තැනැත්තා විය යුතුය.

IV. ජාතික සංවිධායක තනතුරු තුනකි. එක් තනතුරක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හිමි විය යුතුය.

V. උප ලේකම් - සන්ධානයේ පක්ෂවලට හෝ කණ්ඩායම් වලට එක් තනතුර බැගින් ලබා දිය යුතුය.

VI. උප සභාපතිවරු - කණ්ඩායම් පක්ෂවලට හෝ කණ්ඩායම්වලට එක් තනතුර බැගින් ලබා දිය යුතුය.

VII. මාධ්‍ය ප්‍රකාශකවරුන් මණ්ඩලයක් (මධ්‍යම කෘත්‍යාධිකාරි මණ්ඩලය නියෝජනය කරන අය අතරින් හෝ බාහිර අය අතුරින් සිංහල, දමිළ, ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය ඇති සහ කාන්තා තරුණ නියෝජනයන් විය යුතුය.

VIII. නායකත්ව මණ්ඩලය සහ මධ්‍යම කෘත්‍යාධිකාරි මණ්ඩලයේ රැස්වීම් සඳහා නායකත්ව මණ්ඩලය අවශ්‍ය අවස්ථාවලදී මාධ්‍ය ප්‍රකාශකවරුන් සහභාගී කරගත හැක.

(ආ) මධ්‍යම කෘත්‍යාධිකාරි කමිටුව විසින් සාමාන්‍යයෙන් ස්වකීය තීරණයන්ට එළඹිය යුත්තේ සාමූහික එකගත්වය අනුව වුවද තීරණයන්ට එළඹීමේදි සියලුම සාධාරණ පරිශ්‍රමයන් අසාර්ථක වූ අවස්ථාවක බහුතර ඡන්දයක් මගින් එවැනි තීරණයකට එළඹිය හැක්කේය.

## 07. ලේකම් මණ්ඩලය

1. ලේකම්වරයා සහ එක් එක් සාමාජික සංවිධාන විසින් නම් කරනු ලබන උප ලේකම්වරුන්ගේ සාමාජිකත්වයෙන් සමන්විත වන ලේකම් මණ්ඩලයක් තිබිය යුතුය.

2. සන්ධානයේ එදිනෙදා කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීම, න්‍යාය පත්‍රය සකස් කිරීම සහ කෘත්‍යාධිකාරී කමිටුව විසින් නිශ්චය කරනු ලැබීම සඳහා යෝජනා සම්මතයන් කෙටුම්පත් කිරීම මහ ලේකම් මණ්ඩලය විසින් කළ යුත්තේය.

3. ලේකම්වරයා, සන්ධානයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විය යුත්තේය.

4. ලේකම්වරයා විසින් පහත දැක්වෙන දෑ කළ යුත්තේය.

(අ) නායකත්ව මණ්ඩල - මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුව රැස්වීම්, ජාතික සම්මේලනය කැඳවීම් පැවැත්වීම හා වාර්තා පවත්වාගෙන යෑම.

(ආ) මෙම ව්‍යවස්ථාවලියේ විවිධ විධානයන්ට අනුකූලව එක් එක් මැතිවරණයන්ට ලිඛිත නීතීන් මගින් තමාට නියම කරනු ලබන ඒ ඒ කාර්යයන් හා කර්තව්‍යයන් සපුරාලීම.

5. සන්ධානයේ මුදල් සම්බන්ධයෙන් භාණ්ඩාගාරික වගකිව යුතු අතර, සන්ධානයේ අරමුදල් පිළිබඳව ගිණුම් තැබීම ද, ඔහු විසින් කළ යුත්තේ ය. තවද, එම එකතු කිරීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් ඔහු විසින් මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුවට වගකිව යුතු වන්නේය.

6. ඕනෑම මැතිවරණයක දී අපේක්ෂක ලැයිස්තු අත්සන් කිරීම, යම් ආසනයක පුරප්පාඩුවන තනතුරු සඳහා

නම් කිරීම, මධ්‍යම කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තීරණ පරිදි යම් සාමාජිකයෙකු ඉවත් කිරීම, විනය පියවර ගැනීම කළ යුත්තේය. මේ සියලු කාර්යයන් සඳහා නායකත්ව මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුත්තේය.

08. නායකත්ව මණ්ඩලයේ සංයුතිය හා බලතල

සන්ධානයේ ඉහළම බලාධිකාරිය නායකත්ව මණ්ඩලය විය යුත්තේය.

i. මෙකී සන්ධානයට සම්බන්ධවන දේශපාලන පක්ෂයන්හි කණ්ඩායම්වල නායක තනතුරු දරණ සැමගෙන් හෝ එකී දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම් මගින් පත් කරනු ලබන නියෝජිතයන්ගෙන් සමන්විත නායක මණ්ඩලයක් පත් කළ යුතුය. පාර්ලිමේන්තු නියෝජනයක් නොමැති වුවත් නායකත්ව මණ්ඩලය අනුමත කරන්නේ නම් යම් පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට සන්ධානයේ සාමාජිකත්වය ලබා ගැනීමට හැකි අතර එවැනි අවස්ථාවක දී එම පුද්ගලයාට හෝ කණ්ඩායමකට එක් නායකත්ව සාමාජිකත්වය බැගින් හිමි වේ.

ii. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නායකත්ව මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් 25% ක නියෝජිතයින් ප්‍රමාණයක් පත් කළ හැක.

iii. වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නියෝජනය කරන යම් කණ්ඩායමක හෝ පක්ෂයක පාර්ලිමේන්තු මන්ත්‍රීන් පස් දෙනෙකුට එක් නායකත්ව මණ්ඩල නියෝජිතයෙකු බැගින් පත් කිරීමට එම කණ්ඩායමට හෝ පක්ෂයට බලය හිමි වේ.

iv. සන්ධානයේ සියලු කටයුතු මෙහෙයවීම, සියලු දේශපාලන තීන්දු ගැනීම, පත්කර ගන්නා ලද නිලධාරීන් හා මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුවේ සාමාජිකයන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීම, සන්ධානයේ සාමාජිකත්වයෙන් හා කෘත්‍යාධිකාරී මණ්ඩලයෙන් ඉවත් කිරීම, ජාතික මැතිවරණයක දී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ තීරණ ගැනීම, නායකත්ව මණ්ඩලයට පැවරේ. සන්ධානයේ අනෙකුත් සියලු මණ්ඩල හා අනුබද්ධ ආයතන නායක මණ්ඩලය ගන්නා තීන්දුවලින් බැදී සිටී. නායකත්ව මණ්ඩලය රැස්වෙන සෑම අවස්ථාවකදීම සන්ධානයේ නායක මුලසුන ගත යුතුය.

v. නායකයා නැතහොත් ඔහු හෝ ඇය නොමැති අවස්ථාවල දී, සුදුසු පරිදි නායකත්ව මණ්ඩලයේ සාමාජිකයන් බහුතර දෙනාගේ කැමැත්ත පරිදි එක් අයෙකු සන්ධානයේ මූලාසනය හොබවනු ලැබිය යුත්තේය.

vi. නායකත්ව මණ්ඩලය හැකිතාක් දුරට බෙදීමකින් තොරව තීරණ ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ නොමැති අවස්ථාවක බහුතර කැමැත්ත මත තීරණ ගැනීම සිදුකළ යුතුය.

vii. සන්ධානයේ අභිවෘද්ධිය උදෙසා සුදුසු අනුශාසක මණ්ඩලයක් පත් කර ගැනීමේ බලය නායකත්ව මණ්ඩලයට හිමි වේ.

## 09. කාරක සභා

1. සන්ධානයේ වැඩ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යෑම සඳහා නායකත්ව මණ්ඩලය විසින් එක් එක් විෂයන්ට අදාළව කාරක සභා පත් කළ යුත්තේය. එසේ පත් කරන අවස්ථාවේ දී කාරක සභාවන්හි විෂය පථය තීරණ ගැනීමේ ව්‍යුහය, ඉවත් වීම සහ ඉවත් කිරීම පිළිබඳ පටිපාටියේ සඳහන් කළ යුත්තේ ය. අවශ්‍ය නම් කෘත්‍යාධිකාරී සභාවේ සහ නායකත්ව මණ්ඩලයේ අනුමැතියෙන් මේ සඳහා පොදු ක්‍රමවේදයක් සකස් කළ හැක්කේය.

2. නොයෙක් ක්ෂේත්‍රයන් හි විවිධ ප්‍රදේශවල, දිස්ත්‍රික්ක හා පළාත්වල සන්ධානයේ කර්තව්‍යයන් නොකඩවා කරගෙන යාමේ සහ/හෝ සම්බන්ධීකරණය කිරීමේ කාර්යයන් සඳහා මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුව විසින් කාරක සභා පිහිටු විය හැක්කේය.

3. ස්වකීය කර්තව්‍යයන් සම්බන්ධයෙන් මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුව විසින් සම්පාදිත නීතිවලට අනුකූලව පූර්වෝක්ත වගන්තියේ සඳහන් කාරක සභා විසින් ක්‍රියා කළ යුත්තේය.

4. සන්ධානයේ ප්‍රවර්ධනය අනෙකුත් පක්ෂ හා කණ්ඩායම් සම්බන්ධ කර ගැනීම සන්ධානයේ ප්‍රතිපත්ති සකස් කිරීම ජාතීන් අතර සුහදතාවය ඇති කිරීම හා ජාත්‍යන්තර සම්බන්ධතා ඇතිකර ගැනීම යන ආදී කටයුතු සන්ධානයට සම්බන්ධ සන්ධාන නිලධාරීන් අතරින් හෝ බාහිර විශේෂඥ දැනුමක් ඇති සම්පත් දායකයින්ගෙන් කාරක සභා පිහිටුවා ගත හැකිය.

10. සාමාජිකත්ව සංවිධාන පිළිබඳ පිළිවෙත

(අ) මෙම ව්‍යවස්ථාවලියේ අඩංගු යම් යම් විධිවිධානයන් හි කුමක් සඳහන් වුවද, ඒ ගැන නොතකා ස්වාධීන දේශපාලන වශයෙන් ස්වකීය කටයුතු කරගෙන යාමේ හා ඒ සියලු කර්තව්‍යන් සපුරාලීමේ අයිතිය සාමාජික සංවිධානයන්ට තිබිය යුත්තේය.

එසේ වුවද, සන්ධානය සහ/හෝ එහි යම් සාමාජික සංවිධානයක් සහ/හෝ සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රසිද්ධියේ විවේචනයට ලක් කිරීම සාමාජික සංවිධානයක් හෝ කණ්ඩායමක් විසින් නොකළ යුතුය.

තවද, සංවිධානය විසින් අපේක්ෂකයකු හෝ අපේක්ෂකයන් ඉදිරිපත් කොට යම් මැතිවරණ කාර්යයක යෙදී සිටින විට,

i. ස්වකීය වූ අපේක්ෂකයෙකු හෝ අපේක්ෂකයන් නම් කරමින්, නැතහොත් සන්ධානයට සම්බන්ධ නොවූ වෙනත් අපේක්ෂකයෙකුට හෝ අපේක්ෂකයන්ට ආධාර කරමින් එම මැතිවරණයට සහභාගී වීම සහ /හෝ,

ii. එම මැතිවරණය හෝ මැතිවරණයන් පිළිබඳව වූ සන්ධානය තීරණයන්ට අනුකූල නොවන යම් ප්‍රසිද්ධ ප්‍රකාශනයන් කිරීම හෝ මතයක් ප්‍රකාශයට පත් කිරීම නොකළ යුතුය.

(ආ) මෙම සන්ධානය සාමාජික පක්ෂවල හෝ කණ්ඩායම්වල ඕනෑම සාමාජිකයෙකුට සිය අභිමතය පරිදි එකී පක්ෂයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමට ඇති සම්පූර්ණ අයිතිය මෙම ව්‍යවස්ථාවේ කිසිදු ප්‍රතිපාදනයකින් අහිමි නොවන්නේය.

## 11. විශේෂ විධිවිධාන

1. (අ) සන්ධානයෙන් ඉල්ලා අස්වීමට කවර වූ සාමාජික සංවිධානයකට අයිතිය ඇත්තේය.
(ආ) සන්ධානයෙන් ඉල්ලා අස්වීම සඳහා වූ අදහස අනෙකුත් සාමාජික සංවිධානවලට කලින් දැනුම් දී මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුවේ රැස්වීමක දී සලකා බැලීම සඳහා එම අදහස ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව පමණක් සාමාජික සංවිධානයක ඉල්ලා අස්වීම බලාත්මක විය යුත්තේය.

2. ව්‍යවස්ථාවලියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ පක්ෂයේ තීරණයන්ට පටහැනිව ක්‍රියාකරන යම් සාමාජික පිළිගත් දේශපාලන පක්ෂයක් හා කණ්ඩායමක් මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටු හා නායකත්ව මණ්ඩලය විසින් අනුමත කරනු ලබන යෝජනා සම්මතයක් මගින් නෙරපා දමනු ලැබිය හැකි අතර, සන්ධානයට ඇතුළත් සාමාජික සංවිධානවල තුනෙන් දෙකක ඡන්දයකින් එම යෝජනා සම්මතය ස්ථිර කළ යුතු වන්නේය.

3. ජනාධිපති මැතිවරණය සඳහා අපේක්ෂකයෙකු නම් කිරීම හෝ එසේ නොවන අවස්ථාවක ඉදිරිපත් වී සිටින අපේක්ෂකයෙකුට සහාය දීම පිළිබඳව නායකත්ව මණ්ඩලයේ බහුතර කැමැත්ත මත තීරණය විය යුතුය.

4. සන්ධානය විසින් නම් කිරීම මත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ ප්‍රාදේශීය සභා ඇතුළු වෙනත් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු එසේ පත්වීමෙන් පසුව, එම ධූරය හිස් වූ විට එම පුරප්පාඩුව පිරවීම සඳහා සන්ධානයේ ලේකම්වරයා විසින් ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක එම

තෝරාපත් කරනු ලබන මන්ත්‍රී ධූරය සඳහා තරග කරනු ලැබූ අවස්ථාවේදී ඒ පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හෝ පළාත් සභා මන්ත්‍රීවරයා හෝ වෙනත් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු හෝ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු සාමාජියෙකු වශයෙන් සිටින පක්ෂයේ හෝ කණ්ඩායම ඉදිරිපත් කරනු ලබන නාම යෝජනාව එම පුරප්පාඩුව පිරවීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා යැවීම සන්ධානයේ ලේකම්වරයාගේ යුතුකමක් වන්නේය.

(අ) සන්ධානයේ නාම යෝජනා මත තෝරාපත් කරගන්නා ලැබූ පාර්ලිමේන්තු හෝ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ හෝ පළාත් සභා මන්ත්‍රීවරුන් ඇතුළු වෙනත් පළාත් පාලන ආයතනයක හෝ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ විනයානුකූලව එම තෝරා පත් කරනු ලැබූ අවස්ථාවලදී ඔවුන් සාමාජිකයන් වශයෙන් සිටි සාමාජික පක්ෂය හෝ කණ්ඩායම් වෙත පැවරෙන්නෙය.

(ආ) සන්ධානයේ නාම යෝජනා මත තෝරා පත් කර ගන්නා ලැබූ පාර්ලිමේන්තු හෝ පළාත් සභා හෝ වෙනත් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු හෝ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු තමා තෝරා පත් කර ගනු ලැබූ මන්ත්‍රී ධූරය සඳහා තරග කළ අවස්ථාවේදී තමා සාමාජිකයෙකු වූ සාමාජික සංවිධානයෙන් නෙරපා දමනු ලැබූ අවස්ථාවක අදාළ සාමාජික සංවිධානයේ (යථායෝග්‍ය පරිදි) ප්‍රධාන ලේකම්වරයා හෝ ලේකම්වරයා විසින් එම නෙරපීම පිළිබඳව තමා වෙත දැනුම් දුන් වහාම ඒ බව අප්‍රමාදව මැතිවරණ කොමසාරිස්වරයා හෝ අදාළ පළාත් සභා ලේකම්වරයා වෙත දැනුම් දීම සන්ධානයේ ලේකම්වරයාගේ කාර්යයක් වන්නේය.

## ව්‍යවස්ථාවලියේ සංශෝධන

ජාතික සම්මේලනයකදී පැමිණ සිටීමට හා සහභාගී වීමට හිමිකම ඇති මුළු නියෝජිත සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක බහුතරයක් මගින් එම ජාතික සම්මේලනයේදී සම්මත කරගනු ලබන යෝජනා සම්මතයකින් සන්ධානයේ ව්‍යවස්ථාවලිය සංශෝධනය කළ හැකි වන අතර, එම තත්කාලයේ සන්ධානයට සංයුක්ත වන්නා වූ සාමාජික සංවිධානවල තුනෙන් දෙපංගුවක සාමාජිකයින් විසින් එම යෝජනා සම්මත ස්ථිර කිරීමෙන් එය බලාත්මක වන්නේය.

මෙය 2024.02.06 වන දින පවත්වන ලද පොදුජන එක්සත් පෙරමුණේ ජාතික සම්මේලනයේදී යෝජනා ස්ථිරත්වයෙන් සම්මත කරගන්නා ලද පොදුජන එක්සත් පෙරමුණේ සංශෝධිත ව්‍යවස්ථාවේ පිටපතක් බව සහතික කරමි.

සාගර කාරියවසම්
ලසන්ත අලගියවන්න
ප්‍රධාන ලේකම්
පොදුජන එක්සත් පෙරමුණ.
අංක: 301, ටී.බී. ජයා මාවත,
කොළඹ 10.